**ජාතික ආරක්ෂක අරමුදල - 2020**
**----------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**--------------**

**1.1 මතය**
**------**

ජාතික ආරක්ෂක අරමුදලේ 2020 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**
**--------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**
**----------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරි බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් " මනාලෙස සැලසුම් කරන ලද " අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 1985 අංක 09 දරන ආරක්ෂක අරමුදල් පනතේ 13 වගන්තිය. | පනතේ විධිවිධාන ප්‍රකාරව අරමුදලේ 2018 හා 2019 වර්ෂවල මූල්‍ය ප්‍රකාශන සහ විගණකාධිපති වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතුකර නොතිබුණි. | 2018 හා 2019 වර්ෂයේ විගණන වාර්තා මෙම අමාත්‍යාංශය මගින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරමින් පවතී. | 1985 අංක 09 දරන ආරක්ෂක අරමුදල් පනතේ 13 වගන්තිය ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ආ) 1985 අංක 09 දරණ ජාතික ආරක්ෂක අරමුදල් පනතේ 09 වන වගන්තිය | තම රාජකාරී ඉටුකරන අතර තුර තුවාල ලැබූ හෝ මියගිය සන්නද්ධ හමුදාවල සමාජිකයන්ට හා පවුල් වලට ප්‍රතිලාභ ගෙවීමට අතිරේකව පනතේ විධිවිධාන ප්‍රකාරව ජාතික ආරක්ෂාව ප්‍රවර්ධනය කිරීමට සහ සහතික කිරීමට අදාල කාර්යය භාරය සඳහා සමාලෝචිත වර්ෂය තුලදීද වැඩසටහන් සැලැසුම්කර නොතිබුණි. | ජාතික ආරක්ෂාව ප්‍රවර්ධනය කිරීමට සහ සහතික කිරීමට අදාළව පාලක මණ්ඩලය සතු කාර්යභාරය පිළිබඳ ඉදිරි පාලක මණ්ඩල රැස්වීමේදී අවධානය යොමු කිරීමට සටහන් තබා ගන්නා ලදි. | 1985 අංක 09 දරණ ජාතික ආරක්ෂක අරමුදල පනතේ 09 වන වගන්තිය ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ)මුදල් රෙගුලාසි 262(2) | වවුචර් වලට ගෙවීම් කිරීම සම්බන්ධයෙන් සිදුවිය හැකි ද්විත්ව ගෙවීම් ඇතුළු වැරදි අවම කර ගැනීම පිණිස මුදල් රෙගුලාසි 261(1) සහ 262(2) මගින් දක්වා ඇති පාලන විධිවිධාන අනුගමනය කර නොතිබුණු එකතු වටිනාකම රු:48,236,368 ක ගෙවීම් අවස්ථා 24 ක් පැවති බව නියදි පරීක්ෂාවේ දී අනාවරණය විය. | ඉදිරියේදී සියලුම වවුචර් පත් හා ඊට අදාළ ලේඛන වල ගෙවන ලදී මුද්‍රාව තැබීමට සටහන් තබා ගන්නා ලදී. | මුදල් රෙගුලාසි 262(2) ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ඇ)මුදල් රෙගුලාසි 392(අ), (ඇ) හා 393 | චෙක්පත් අවලංගු කිරීම හෝ නැතිවීම නිසා හිලව් චෙක්පතක් නිකුත් කිරීමේදී මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු නොකළ එකතු වටිනාකම රු. 54,420 ක්වූ චෙක්පත් 14 ක් පැවති බව නිරීක්ෂණය විය. | දීර්ඝ කාලයක් තිස්සේ ගෙවීම සඳහා ඉදිරිපත් නොවූ චෙක්පත් පවතින බව හඳුනාගන්නා ලද අතර ගිණුම් නිරවුල් කිරීමේ පරමාර්ථයෙන් හිලව් චෙක්පත් නිකුත් කරන ලදී. | මුදල් රෙගුලාසි 392(අ),(ඇ) හා 393 ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ඉ)මුදල් රෙගුලාසි 395 (ඇ) | අරමුදලේ බැංකු ගිණුම සම්බන්ධයෙන් සැසඳුම් ප්‍රකාශ නියමිත කාලය තුල පිලියෙල කළ බවට සාක්ෂි නොවුණි. ඒ හේතුවෙන් වලංගු කාලය තුල ගෙවීම් සඳහා ඉදිරිපත් නොවූ චෙක්පත් සම්බන්ධයෙන් කාලීන ක්‍රියාමාර්ග ගැනීම වැලකී තිබුණි. | ඉදිරියේදී අදාළ කාල සීමාව තුළ බැංකු සැසඳුම් සැකසීමට වග බලාගන්නා බව සටහන් තබා ගන්නා ලදී. | මුදල් රෙගුලාසි 395 (ඇ) ප්‍රකාරව කටයුතු කල යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

--------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

--------------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 79,023,742 ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 74,497,183 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 4,526,559ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් ආයෝජන පොලී ආදායම රු. 14,780,429 කින් අඩුවීම හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ)"විරුසිසු ශිෂ්‍යත්ව ප්‍රදීප" වැඩසටහන යටතේ මියගිය හා ආබාධිත ත්‍රිවිධ හමුදා හා පොලිසියේ රණවිරුවන්ගේ 2019 පහ වසර ශිෂ්‍යත්ව විභාගය සමත් දරුවන් 150 ක් සඳහා රු. 25,000 බැගින් ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීම 2020 වර්ෂයේ දෙවන කාර්තුව තුල අවසන් කිරීමට සැලසුම්කර ඇතත් 2020 දෙසැම්බර් 31 වන විටත් සිසුන් වෙත ශිෂ්‍යත්ව ප්‍රදානය කර නොතිබුණි. 2019 පහ වසර ශිෂ්‍යත්ව ප්‍රතිඵල 2019 සැප්තැම්බර් මස නිකුත් කර තිබුණු අතර ප්‍රතිඵල නිකුත් වීමෙන් වර්ෂ 1 මාස 3 කට අධික කාලයක් ගතවී ඇතත් ශිෂ්‍යත්ව ප්‍රදානයේ ප්‍රතිලාභ කාලීනව උපයෝජනය කිරීමේ අවස්ථාව අහිමිවී තිබුණි. | රටෙහි පැවති කොවිඩ් - 19 වසංගත තත්ත්වය හේතු කොට ගෙන 2020 වර්ෂය තුළ ප්‍රතිලාභ ලබාදීම සිදු නොවුණි. ශිෂ්‍යාධාර ලබාදීම නුදුරේදීම, ඉතා කඩිනමින් සිදු කිරීමට පියවර ගෙන ඇත. | අනුමත ක්‍රියාකාරී සැලැස්ම අනුව කටයුතු කල යුතුය. |
| (ආ)මියගිය හා ආබාධිත ත්‍රිවිධ හමුදා, පොලිස් විරුවන් හා සිවිල් සේවකයින්ගේ අඩක් නිමකල නිවාස 322 ක් සම්පූර්ණ කර ගැනීම සඳහා රු. 750,000 බැගින් ආධාර මුදල් වාරික 3 ක් යටතේ ගෙවා නිම කිරීමට සැලසුම් කලද නිවාස 321 ක් සඳහා අවසන් වාරිකය ගෙවා නොතිබුණි. ඒ අනුව මෙම කාර්යයන්හි මූල්‍ය කාර්යසාධනය සියයට 64 ක මට්ටමක පැවතියද අපේක්ෂිත භෞතික කාර්යසාධන මට්ටම ළඟාකරගෙන නොතිබුණි. | 2020 වර්ෂයේ මුල් කාර්තුවේ සිට රටෙහි පැවැති කොවිඩ් - 19 වසංගත තත්ත්වය හේතුවෙන් ප්‍රතිලාභී රණවිරුවන් විසින් ඔවුන්ගේ නිවාසයන්හි අදාළ ඉදිකිරීම් අවසන් කිරීමට ප්‍රමාදවීම හේතුවෙන් වාරික නිදහස්කර නැත. | අනුමත ක්‍රියාකාරී සැලැස්ම අනුව කටයුතු කල යුතුය. |
| (ඇ)නර්ඩ් තාක්ෂණය හැදෑරීම තුළින් ස්වයං රැකියා වල යෙදීම සඳහා පුද්ගලයින් 500 කට පුහුණුව ලබාදීම සැලසුම් කළ ද පුද්ගලයන් 24 දෙනකුට පමණක් පුහුණුව ලබා දී තිබුණි. | 2021 වර්ෂයේ, රටෙහි පවතින සෞඛ්‍යමය තත්ත්වය සැලකිල්ලට ගෙන ඉතිරි රණවිරුවන් 33 දෙනෙකු වෙත මෙම පුහුණුව ලබාදී ඇත. | අනුමත ක්‍රියාකාරී සැලැස්ම අනුව කටයුතු කල යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේදී අරමුදලේ කටයුතු සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන පරීක්ෂණයක් සිදුකර නොතිබුණි. | කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් සීමිත කාර්යය මණ්ඩලයක් පමණක් සේවයට කැඳවීමට සිදු වූ බැවින් එම විගණන පරීක්ෂණය සැලසුම් කළ පරිදි පැවැත්වීමට නොහැකි විය. | අරමුදලේ අභ්‍යන්තර පාලන පද්ධතීන් නිසිපරිදි ක්‍රියාත්ම වේද යන්න පරීක්ෂාකිරීම සඳහා අභ්‍යන්තර විගණනයක් සැලැසුම්කල පරිදි ක්‍රියාත්මක කළ යුතුය. |